# රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
## அரச சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
## Ministry of Public Services, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන தொலைபேசி:(94) 011- 2694560 Telephone
ෆැක්ස් தொலைநகல்:(94) 011- 2692254 Fax
ඊ-මේල් மின்னஞ்சல்:dgcs@pubad.gov.lk E-mail
වෙබ් අඩවිය இணையத்தளம்: www.pubad.gov.lk Web Site


මගේ අංකය எனது இல My No: CS/Rec/Vacancies (I)
ඔබේ අංකය உமது இல Your No:
දිනය திகதி: Date: 2022.01.21

සියලුම අමාත්‍යාංශ/ රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
කොමිෂන් සභා ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්/ප්‍රාදේශීය ලේකම්වරුන්

**පුරප්පාඩු තොරතුරු කැඳවීම**

**කළමනාකරණ සේවා නිලධාරි සේවය**

ඒකාබද්ධ සේවයට අයත් නිලධාරින්ගේ ආයතනික කටයුතුවලදී සේවක සංඛ්‍යාව පිළිබඳ තීරණ ගැනීමට මෙම අමාත්‍යාංශයේ PACIS මෘදුකාංගය පවත්වාගෙන යනු ලැබේ. ඒ සඳහා අවශ්‍ය තොරතුරු ඇතුළත් කිරීමට සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට භාවිත නාමය (User name) සහ මුරපද (Password) ලබා දී ඇත.

සැලකිය යුතුයි :- අදාළ භාවිතා නාම/මුරපද නිසි ලෙස ක්‍රියා නොකරයි නම් ඒ සම්බන්ධ විමසීම් යොමු කළ යුතු විද්‍යුත් තැපැල් ලිපිනය (email) pacisnew2022@gmail.com වේ.

02. එහෙත් ආයතන බහුතරයක් අදාළ පරිදි සේවක සංඛ්‍යාව යාවත්කාලීන කර නොමැති බව නිරීක්ෂණය වන බැවින් PACIS මෘදුකාංගය වෙත ප්‍රවේශ වී කාර්ය මණ්ඩලවල තොරතුරු නොපමාව යාවත්කාලීන කරන ලෙස කාරුණිකව දන්වමි.

03. විශේෂයෙන්ම කළමනාකරණ සේවා නිලධාරි සේවයට අදාළව ඔබ ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව, සිටින සේවක සංඛ්‍යාව සහ පවතින පුරප්පාඩු සම්බන්ධයෙන් නවතම දත්ත ඉතා කඩිනමින් PACIS මෘදුකාංගයේ යාවත්කාලීන කරන මෙන් වැඩිදුරටත් ඉල්ලා සිටිමි.

04. තවද 2022.01.21 දින සිට එළඹෙන දින 10ක කාල සීමාව තුළ එම තොරතුරු නිසි ලෙස යාවත්කාලීන කරන ලෙස ද කාරුණිකව දන්වමි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්